# <u>ප්‍රසම්පාදන නිවේදනයයි.</u>
# <u>පිසු/වියළි ආහාර සැපයීම - 2025/2026</u>
# <u>ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව</u>

ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන පහත සඳහන් ළමා සංවර්ධන මධ්‍යස්ථානවලට 2025.12.01සිට 2026.11.30 දින දක්වා කාල සිමාවට පිසු ආහාර හා වියළි ආහාර සැපයිම සඳහා ලංසු කැඳවනු ලැබේ.

| පැකේජය | ළමා සංවර්ධන මධ්‍යස්ථානය | ආපසු නොගෙවන ලංසු ආකෘති පත්‍ර ගාස්තු මුදලින් (රු:) | ආපසු ගෙවන ලංසු සුරක්ෂණය මුදලින් (රු) | වත්කම් සහතිකයේ වටිනාකම(රු) |
|---|---|---|---|---|
| පැකේජ 01 | ගෝතමී ළමා මව්වරුන්ගේ රැකවරණ මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල | 2,500.00 | 40,000.00 | 180,000.00 |
| පැකේජ 02 | සුරක්ෂා බාලක රැඳවුම් මධ්‍යස්ථානය | 2,500.00 | 22,000.00 | 107,000.00 |

(I) මිල ගණන් ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචි පුද්ගලයෙකු, රජයේ ලියාපදිංචි සමිතියක් හෝ සමාගමක් විය යුතුය. එමෙන්ම රජයේ ලියාපදිංචි සමාගමක් නම් එය ශ්‍රී ලංකාවේම ක්‍රියා කිරිම සඳහා බලය ඇති ආයතනයක් විය යුතු අතර, පසුගිය වසරේ විගණනය කළ අවසන් ගිණුම් වාර්තාව හෝ බැංකු ගිණුමේ පසුගිය තෙමසේ බැංකු ප්‍රකාශය ඉදිරිපත් කල යුතුය.

(II) ආහාර සැපයීම සම්බන්ධව ව්‍යාපාර නාම ලියාපදිංචි කර තිබිය යුතුය. ඕනෑම ක්ෂේත්‍රයක පිසු ආහාර සැපයීම පිළිබඳව වසරකට වැඩි පළපුරුද්දක් තිබිම අමතර සුදුසුකමකි. මීට ඉහත අසාධු ගත ලේඛනයට නම ඇතුලත් වු අසාර්ථක කොන්ත්‍රාත්කරුවෙක් නොවිය යුතුය.

(III) **2024.12.31** දිනට පසු ප්‍රාදේශිය ලේකම් විසින් නිකුත් කරන ලද "පොදු 170 " ආකෘතියේ **වත්කම් සහතිකයේ** වටිනාකම තිරුවේ සඳහන් වටිනාකමට වත්කම් සහතික හා ස්ථිර පදිංචිය පිළිබඳ සහතියක් අදාල ප්‍රාදේශිය ලේකම්ගෙන් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුය.

(IV) ඉහත වගුවේ සඳහන් ලංසු සුරක්ෂණ ගාස්තුව ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා කොමසාරිස්ගේ නමින් ඇති බදුල්ල මහජන බැංකුවේ ගිණුම් අංක 269-1-001-7-8440334 දරණ ජංගම ගිණුමට තැන්පත් කර හෝ ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මුදල් සහකාර වෙත මුදලින් ගෙවා එම තැන්පතු ලදුපත ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මුදල් සහකාර වෙත ඉදිරිපත් කල යුතුය. ලංසු ආකෘති පත්‍ර ලබා ගැනිම සඳහා ඉහත වගුවේ සඳහන් ලංසු ආකෘති පත්‍ර ගාස්තුව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මුදල් සහකාර වෙත මුදලින් ගෙවා කුවිතාන්සියක් ලබා ගෙන, එම කුවිතාන්සිය සම්පූර්ණ කරන ලද ලංසු ආකෘති පත්‍රය සමග ඉදිරිපත් කල යුතුය. **2025.11.04 දින සිට 2025.11.18** දින ප.ව. 1.30 දක්වා ලංසු ආකෘති පත්‍ර මෙම කාර්යාලයෙන් ලබා ගත හැකිය.

(V) එක් එක් ආයතන සඳහා ලංසු ආකෘති පත්‍ර යුගලය එනම් මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙක එක් කවරයක බහා කවරයේ වම් පස ඉහල කෙලවරේ "(ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නම - පැකේජ අංකය) පිසු ආහාර සැපයිමේ ලංසු - 2025/2026" යනුවෙන් සඳහන් කර ඊට පහලින් අයදුම්කරුගේ නම හා ලිපිනය සඳහන් කළ යුතුවේ.

(VI) ඉහත වගුවේ සඳහන් එක් ආයතනක් හෝ එකකට වැඩි හෝ සියළුම ආයතන සඳහා එක් පුද්ගලයෙකුට ලංසු මිල ගණන් ඉදිරිපත් කල හැකිය.

(VII) ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මඟින් ලංසු ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන අතර, එම ලංසුපත් **2025.11.19 දින ප.ව. 01.30** දක්වා භාර ගනු ලැබේ. ඒ අනුව අදාල ලංසු නියමිත වේලාවට පෙර ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතුවේ. නැතහොත් එකී වේලාවට පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ආර්.එච්.ගුණවර්ධන මාවත, බදුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, නියමිත දින නියමිත වේලාවෙන් පසු ලැබෙන ලංසු පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(VIII) ලංසු ඉදිරිපත් කිරිම සම්බන්ධව පූර්ව මිල කැඳවීමේ රැස්වීමක් 2025.11.17 දින පෙ.ව. 10.30 ට ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ දි පවත්වනු ලැබේ. එදිනට පෙර ලංසුපත් මිලදි ගන්නා අයට පමණක් එම රැස්වීමට සහභාගි විය හැකිය.

(IX) ලංසු භාර ගැනිම අවසන් වු විට ලංසු ආකෘති පත්‍ර ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රවනාගාරයේදී 2025.11.19 දින ප.ව. 2.30 ට විවෘත කිරිම සිදු කරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසු පත් ඉදිරිපත් කළ ලංසු කරුට සහභාගිවිය හැකිය. ලංසුකරුට පුද්ගලික පැමිණිය නොහැකි නම් ලිඛිතව බලය පවරන ලද නියෝජිතයකු සහභාගි කරවිය හැකි අතර, ඔහු විසින් තම අනන්‍යතාවය තහවුරු කිරිමට සමත් විය යුතුය.

(X) ළමුන්ට ආහාර සැපයිම ඉතා වගකිව යුතු කාර්යයක් වන හෙයින් ලංසු කොන්දේසි උල්ලංඝණය කරන අයදුම්කරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරිම හෝ පිළිගැනිමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවේ. තෝරා ගත් ලංසුකරුට ඒ බව දැනුම්දී සති 01ක් ඇතුලත දි නියම කරනු ලබන ගිවිසුම් ඇප මුදල, මුදලින් තැන්පත් කර/ බැංකු ඇපකරයක් ඉදිරිපත් කර ගිවිසුමට එළැඹිය යුතු අතර, ආහාර සැපයිම 2025.12.01 දින සිට ආරම්භ කළ යුතුවේ.


සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,
ඌව පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව,
අංක 301, ආර්.එච්.ගුණවර්ධන මාවත,
බදුල්ල.
දුරකථන අංකය (- 055 – 2231209) ෆැක්ස් අංකය (-055 – 2231209)